# පිත්ත ප්‍රකෘති පුද්ගලයන්ගේ හා එම සතුන්ගේ චර්යා අතර සම්බන්ධය පිළිබඳ විමර්ෂණාත්මක අධ්‍යයනයක්

# An Analytical Study of Behavioral Characteristic of a *Pitta Prakurthi* Person: Based on Animal Behavior

එස්. එච්. ජේ. සී. අමරසිංහ[1], එස්. පී. මොල්ලිගොඩ[2], ටී. ඩබ්. යූ. සී. පෙරේරා[3]

## හැඳින්වීම හා පර්යේෂණ ගැටලුව

ආයුර්වේද මතානුකූලව එක් එක් පුද්ගලයාට විශේෂ වූ ශාරීරික හා මානසික ස්වභාවයක් ඇත. මෙය ප්‍රකෘතිය නම් වේ. මෙම ප්‍රකෘතිය සඳහා ප්‍රධාන වශයෙන් ම බලපානු ලබන්නේ වාත,පිත, කඵ යන දෝෂත්‍රය වේ. මිනිසාගේ ශරීරය තුළ මෙම දෝෂත්‍රය විවිධ ආකාරයෙන් පවතී. මවගේ ගර්භාෂය තුළ මිනිස් කළලයක් පිළිසිඳ ගැනීමේ දී ශුක්‍ර හා ශ්‍රෝණිත සංයෝග වන අවස්ථාවේ දී වාත දෝෂය බලවත් වූයේ නම් උපදින පුද්ගලයා වාත ප්‍රකෘතිකයෙකු වේ. ශාරීරික දෝෂ තත්ත්වයන් අනුව පුද්ගලයාගේ ප්‍රකෘතිය ආකාර 7 කි. වාත ප්‍රකෘති, පිත්ත ප්‍රකෘති, කඵ ප්‍රකෘති, වාත කඵ ප්‍රකෘති, වාත පිත ප්‍රකෘති, පිත කඵ ප්‍රකෘති, වාත පිත කඵ ප්‍රකෘති යනුවෙනි. මෙය දෝෂ ප්‍රකෘතිය නම් වේ. මීට අමතරව භෞතික ප්‍රකෘති, මානස ප්‍රකෘති සහ වෙනත් ලෙස ප්‍රකෘතිය වර්ග කර ඇත. ප්‍රකෘතිය සඳහා පහත සාධක හතර ද බලපානු ලබයි. ශුක්‍ර හා ශ්‍රෝණිත ප්‍රකෘතිය, එනම් මව්පියන්ගේ ප්‍රකෘතියට අනුකූල ව ශුක්‍ර හා ශ්‍රෝණිතවල ප්‍රකෘතිය. කාල ගර්භ ප්‍රකෘතිය, කාල ගර්භ ප්‍රකෘතිය යනු ඒ අවස්ථාවෙහි පවතින ඍතුව, දිවා - රාත්‍රි කාලයන්ගේ ප්‍රකෘතිය යි. මාතුරාහාර විහාර ප්‍රකෘති, එනම් මව ගනු ලබන ආහාර විහාරයන්ගේ ප්‍රකෘතියයි. පංච මහා භූතයන්ගේ ප්‍රකෘති, එනම් පිළිසිඳ ගන්නා අවස්ථාවේ පවතින පංච මහා භූතයන්ගේ ප්‍රකෘතියයි. මීට අමතරව ජාතිය, කුලය, දේශය, කාලය, වයස, බලය සහ තමන්ගේ ආත්මය යන කරුණු සප්තකය අනුව ද ප්‍රකෘතිය ආකාර හතකට බෙදේ. දෝෂ ප්‍රකෘතියට අනුව වාත, පිත්ත, කඵ ප්‍රකෘතියට අයත් පුද්ගලයන්ගේ ස්වරූපය විවිධ සත්ත්වයින්ට සමාන කරමින් ආයුර්වේද සංහිතා ග්‍රන්ථවල කරුණු දක්වා තිබේ. මෙම අධ්‍යයනය මගින් පිත්ත ප්‍රකෘති පුද්ගලයා සමාන කර ඇති සතුන් කවුරුන්දැයි හඳුනාගෙන එම සතුන්ගේ චර්යාවන් සියුම්ව විශ්ලේෂණය කර පිත්ත ප්‍රකෘතික පුද්ගලයන් හා එම සතුන්ගේ චර්යා අතර සම්බන්ධය පිළිබඳව අධ්‍යයනය කිරිම සිදු කෙරේ.

---

[1] කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය (jayaniamarasingha.ja@gmail.com)
[2] කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
[3] 2.කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණ ක්‍රියාවලිය සඳහා දත්ත රැස්කරනු ලබන්නේ ආයුර්වේද සංහිතා ග්‍රන්ථ මූලික කරගෙනය. මීට අමතරව ඒ හා අදාල විවිධ සඟරා පොත්පත් පර්යේෂණ ලිපි ලේඛන අධ්‍යයනය කර ඇත. සුදුසු ලෙස අන්තර්ජාලය භාවිතය ද සිදුකරන ඇත. එසේ රැස්කරගනු ලැබූ දත්ත විශ්ලේෂණය මගින් නිගමනයන්ට එළඹෙන ලදී.

## සාකච්ඡාව ප්‍රතිඵල හා නිගමන

ආයුර්වේද මූලික ග්‍රන්ථ වන චරක සංහිතාව , සුශ්‍රැත සංහිතාව , අෂ්ටාංගහෘදය සංහිතාව හා භාව ප්‍රකාශය යන ග්‍රන්ථවල සියල්ලෙහිම පිත්ත ප්‍රකෘතික පුද්ගලයාගේ ශාරීරික හා මානසික ලක්‍ෂණ සඳහන් කර ඇති මුත් පිත්ත ප්‍රකෘතික පුද්ගලයාගේ ස්වභාවය විවිධ සතුන්ගේ ස්වභාවයට සමාන කර දක්වා ඇත්තේ සුශ්‍රැත, අෂ්ටාංග හෘදය හා භාව ප්‍රකාශය යන ග්‍රන්ථ තුනේ පමණි. සුශ්‍රැත සංහිතාවේ පිත්ත ප්‍රකෘතික පුද්ගලයාගේ ස්වභාවය සර්ප, බකමූණු, ගඳඹු ,යක්‍ෂ, බළල්, වඳුරු, ව්‍යාඝ්‍ර, වලස්, මුගටි යන සතුන්ගේ ස්වභාවයට සමාන කර ඇත. අෂ්ටංගහෘදය සංහිතාවේ හා භාව ප්‍රකාශය යන ග්‍රන්ථ දෙකෙහි පිත්ත ප්‍රකෘතික පුද්ගලයාගේ ස්වාභාවය කොටි, වලස්, වඳුරු, බළල්, යක්‍ෂ යන සතුන්ගේ ස්වාභාවයට සමාන කර ඇත.

මෙම ග්‍රන්ථවලට අනුව පිත්ත ප්‍රකෘතික පුද්ගලයා පහත සඳහන් ලක්‍ෂණ වලින් යුක්ත පුද්ගලයෙකි. උෂ්ණය නො ඉවසන, රත් වූ මුහුණු ඇති, සියුමැලි, සුදුපාට අඟපසඟ ඇති, මුහුණේ දුඹුරු ලප සහිත, ඉක්මනින් ඇඟ රැලි නර ගැනීම් හා තට්ටය පැදීම යන ලක්‍ෂණ සහිත, තියුණු පැරකුම් ඇති, තියුණු කුසගිනි සහිත දුක් කරදර ඉවසීමේ අපොහොසත්, සිරුරෙහි දුගඳ සහිත මඳ වූ දරුඵල සහිත, සීඝ්‍රව කිපෙන, සීඝ්‍රව පහන් වන, බුද්ධිමත්, තෙජස් සහිත, බියෙන් හිස පහත් නො කරන බලවතකු හමුවේ වුවත් මෘදු නො වන, මල්දම් විලේපන පැළඳුම් යන ඒවා ප්‍රිය, යහපත් චරිත සහිත,සාහසික, බලවත්, සිසිල ප්‍රිය කරන, ක්‍රෝධ, මධ්‍යපාන, හිරුරැස් යන ඒවායින් රතුවන, උණුසුම් සිරුරු සහිත යන ලක්‍ෂණවලින් යුක්ත පුද්ගලයෙකි.

සතුන්ගේ බාහිර ස්වරූපය මිනිසාගේ බාහිර ස්වරූපය හා සන්සන්දනය අපහසු වුවද චර්යාත්මක ලක්‍ෂණයන් සැසඳීම සිදුකළ හැක. එසේ සැසඳීමේ දී ඉහත සඳහන් කරන ලද බොහෝ චර්යාත්මක ලක්‍ෂණවලට පිත්ත ප්‍රකෘතික පුද්ගලයාගේ ස්වභාවය සමාන කර ඇති සතුන්ගේ ලක්‍ෂණවලට සමාන බව දැකගත හැකි විය.

කොටියා ගත්විට ඔහු උෂ්ණය නො ඉවසන සතෙකි. ඔහු තම ශරීරයේ උණුසුම අඩුකර ගැනීමට ජලයේ බැස සිටීම හා උණුසුම් සහිත දිනවල සෙවන සහිත ගස්

යටට වී සිටීම සිදුකරයි. තියුණු කුසගිනි සහිත සතෙකි. දවසේ වැඩි කාලයක් ආහාර සොයමින් කාලය ගත කරයි. සීඝ්‍රව කිපේ, බුද්ධිමතෙකි, තේජස්වතෙකි. බියගුලු නො වේ, සාහසිකය, උණුසුම් සිරුරු සහිත වේ.

වලහා ගත් විට ඔහු බුද්ධිමත් සතෙකි. සාමාන්‍යයෙන් විනෝදයෙන් කාලය ගතකරන සතෙකි. නමුත් සීඝ්‍රව කිපේ. ශක්තිවන්ත වේ. බලවන්ත වේ. තියුණු කුසගිනි සහිත සතෙකි. තමා රැස් කරගත් ආහාර මතු ප්‍රයෝජනය සඳහා ගබඩාකර තබයි. බියගුලු නො වේ.

සාහිත්‍යයේ දි මුගටියා (Snake Fighters) ලෙස හඳුන්වයි. බියගුලු නො වන බලවත් සතෙකි. මොහුගේ ශරීරයෙන් තියුණු ගඳක් වහනය වේ. සීඝ්‍රව කිපේ. බුද්ධිමතෙකි. තනිව හෝ කණ්ඩායමක් ලෙස ජීවත් වේ. කණ්ඩායමක් ලෙස සිටිමේ දී එක් සතෙකු සෑම විට ම බාහිර පරිසරය පිළිබඳව විමසිල්ලෙන් සිටියි. පැයකට වරක් මාරුවෙන් මාරුවට මේ ආකාරයෙන් කණ්ඩායමේ සෑම සතෙකු ම ආරක්ෂක රාජකාරියේ යෙදේ. උණුසුම් සිරුරු සහිත වේ.

වඳුරාගේ ලක්ෂණ බොහෝ දුරට මිනිසාගේ ලක්ෂණවලට සමාන වේ. වැඩුණු මොළයක් සහිත සතෙකි. බුද්ධිමතෙකි. බියගුලු නො වේ. උණුසුම් සිරුරු සහිත වේ. සීඝ්‍රව කිපේ.

බළලා සමාජශිලී සතෙකි. තියුණු කුසගිනි සහිත සතෙකි. බලවතෙකු හමුවේ වුව ද මෘදු නො වේ. උණුසුම් සිරුරු සහිත වේ. බුද්ධිමතෙකි. සීඝ්‍රව කිපේ.

මේ ආකාරයෙන් බකමූණු, සර්ප යන සතුන්ගේ ද පිත්ත ප්‍රකෘතිකයා සතු ලක්ෂණ අඩු වැඩි ලෙස පිහිටයි.

සාහිත්‍යයේ දී යක්ෂ ලෙස සතෙකු පිළිබඳ සඳහන් වුව ද සත්ව ලෝකයේ එබඳු සතෙකු ජීවමානව නොමැත.

ඒ අනුව මෙම පර්යේෂණයෙන් ප්‍රකට වන්නේ මිනිසා පරිණාමයෙන් අනෙකුත් සතුන්ට සාපේක්ෂව උසස් තලයක සිටිනා බවට නිගමනය වී තිබුණ ද ඉහත සතුන්ගේ බොහෝ චරිත ලක්ෂණ පිත්ත ප්‍රකෘතික පුද්ගලයන් තුළ ද පවතින බව ය.

**Keywords** - Prakurthi, Dosha, Mathuraharavihara,Kalagarbha,Gadabhu

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

කුමාරසිංහ, ආරියදාස, *චරක සංහිතාව* (1993) ආයුර්වේද දෙපාර්තමේන්තුව, කොළඹ.

බුද්ධදාස. ආර්, *සුශ්‍රැත සංහිතාව* (1962) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

බුද්ධදාස. ආර්, *අෂ්ටාංග හෘදය සංහිතාව* (1964) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

බුද්ධදාස. ආර්,*භාවප්‍රකාශය I වන කාණ්ඩය* (1981) ආයුර්වේද දෙපාර්තමේන්තුව, කොළඹ.